# ඇබෑර්තු

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## තාක්ෂණ නිලධාරී - ප්‍රාථමික කළමනාකරණ කාණ්ඩය (JM 1-2 Gr. II)

## කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA 1-2 Gr. III)

## තාක්ෂණ නිලධාරී - තනතුරු 07

**සුදුසුකම්**

**බාහිර (පහත 01, 02, 03 හෝ 04)**

**අධ්‍යාපනික:**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ඉංජිනේරු, තාක්ෂණ හෝ විද්‍යා විෂය ධාරාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

   (විද්‍යා විෂය ධාරාවෙහි පහත සඳහන් විෂයන්ගෙන් එක් විෂයක් ඇතුළුව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ආහාර තාක්ෂණය, රෙදිපිළි, ක්ෂුද්‍රජීවී විද්‍යාව, පරිසර විද්‍යාව, ධීවර, කෘෂිකර්මය, ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, අණුක ජීව විද්‍යාව, ගණිතය හෝ සංඛ්‍යානය)

2. අදාළ ක්ෂේත්‍රයේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

3. අදාළ ක්ෂේත්‍රයේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සහ**

   සංස්ථාවක, මණ්ඩලයක හෝ කීර්තිමත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද.

4. අදාළ ක්ෂේත්‍රයේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සහ**

   සංස්ථාවක, මණ්ඩලයක හෝ කීර්තිමත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) MA 2-2 II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය**

අයදුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරගකාරී විභාගයක ප්‍රතිඵල මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවාගැනීම් සිදු කරනු ලැබේ. පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කොටස් හතරකින් සමන්විත (පැය 03 ක) ප්‍රශ්න පත්‍රයක් ලබා දෙනු ලැබේ.

- ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය
- අභියෝග්‍යතාව
- තනතුරට අදාළ විෂය දැනුම
- පරිගණක සාක්ෂරතාවය

**වැටුප් පරිමාණය :** LKR 74,010.00 -10 X1,360.00 - LKR 87,610.00

## කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) - තනතුරු 36

**සුදුසුකම්**

**බාහිර**

**අධ්‍යාපනික:**

1) අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව පහත විෂයන් ඇතුළුව එකවර විෂයයන් හයකින් සමත් වී තිබීම.
   - i. සිංහල/ දෙමළ
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය

   **සහ**

   අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර විෂයයන් තුනකින් සමත් වී තිබීම (සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය සහ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය හැර)

**අභ්‍යන්තර**

පහත සඳහන් සුදුසුකම් සමත් ප්‍රාථමික මට්ටමේ කුසලතා ඇති, අර්ධ කුසලතා ඇති සහ නුපුහුණු යන කාණ්ඩවල සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ.

1) අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව පහත විෂයන් ඇතුළුව විෂයයන් හයකින් සමත් වී තිබීම.
   - i. සිංහල/ දෙමළ
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය

   **සහ**

2) ප්‍රාථමික මට්ටමේ කුසලතා, අර්ධ කුසලතා, කුසලතා නොමැති කාණ්ඩවල අවම වශයෙන් අවුරුදු පහක (05) පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සහ ඉහත සේවක කාණ්ඩය යටතේ ස්ථිර තනතුරක සතුටුදායක සේවාවක් ලබා තිබීම.

**බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය**

අයදුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරගකාරී විභාගයක ප්‍රතිඵල මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවාගැනීම් සිදු කරනු ලැබේ. පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කොටස් තුනකින් සමන්විත (පැය 03 ක) ප්‍රශ්න පත්‍රයක් ලබා දෙනු ලැබේ.

- ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය
- අභියෝග්‍යතාව/ සාමාන්‍ය දැනීම
- පරිගණක සාක්ෂරතාවය

**වැටුප් පරිමාණය**

LKR 46,220.00 -10 X540.00-LKR 51,620.00

**සෑම අයදුම්කරුවෙකුම**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීම සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයක් විය යුතුය.

**වයස**

අවුරුදු 22 කට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ)

**අනෙකුත් වරප්‍රසාද**

1. ලබානොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවනු ලැබේ.
2. ජීවිතාරක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණාවරණයක් හිමි වේ.
3. සීමාවනට යටත්ව බාහිර වෛද්‍ය වියදම් ගෙවනු ලැබේ.
4. මහා භාණ්ඩාගාරය මගින් අනුමත වාර්ෂික දිරි දීමනා ගෙවනු ලැබේ.
5. පිළිගත් වෘත්තීයමය වට පිටාවක රැකියාව කිරීමේ අවස්ථාව
6. සන්නිවේදන දීමනාව (තාක්ෂණ නිලධාරී තනතුරු සඳහා පමණි)

**සබැඳිය තාක්ෂණ නිලධාරී**
**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**
**https://forms.gle/G7JK4iyMMySTi3KN6**

**සබැඳිය කළමනාකරණ සහකාර**
**(තාක්ෂණ නොවන) - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**
**https://forms.gle/ocdjpfKwv9oPPp137**

අයදුම්කරුවන් පහත සබැඳිය හෝ QR කේතය හරහා අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු පෝරමය බාගත කර අයදුම්කරු විසින් නිසි ලෙස අත්සන් කර එම සබැඳිය හෝ QR කේතය හරහා මෘදු පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත්‍රයේ දෘඩ පිටපත 2025-06-18 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. විභාග ගාස්තුව සඳහා ගාස්තු අය කරනු ලබන්නේ ලැබුණු අයදුම්පත් ගණන අනුව නිසා එම මුදල පසුව දැනුම් දෙනු ලබන අතර, විභාග ගාස්තුව ගෙවීමෙන් පසුව පමණක් විභාග ප්‍රවේශ පත්‍රය අයදුම්කරු වෙත යවනු ලැබේ.

රාජ්‍ය අංශයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය. ලිපියේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.**
**දුරකථන 011-2671567 -72- 011 2019600**